WORKED

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,425—1958 ජූලි 15 වැනි අඟහරුවාද—15.7.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය–සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

කේ. ඩී. 67 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය — වී—තොග සහ සිල්ලර

### 1950හේ අංක 29 දරන මිල පාලන පනත

### නියෝගය

මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක තැන්පත්, ඇලන් බැසිල් සැමුවෙල් නේසරාජා පුල්ලෙනායගම් වන මම, 1950හේ අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි වගන්තියත් සමග කියැවෙන 3 (2) වෙනි වගන්තියෙන් නියෝජ්‍ය (ආහාර) මිල පාලක තැනකට පැවරී ඇති බලතල අනුව—

(1) අංක 10,928 හා 1956යේ මැයි මස 11 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රකාශිත, මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවර එළි දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට කොට්ඨාශයේ වී විකිණිය හැකි වැඩිම මිළ ගණන් නියමිත අංක කේ. ඩී 41 හා 1956යේ මැයි මස 4 වෙනි දින දරණ ආහාර මිල නියෝගය, 1958වේ ජූලි මස 10 වෙනි දින සිට අවලංගු කරමි.

(2) 1958වේ ජූලි මස 10වෙනි දින සිට, මීට යාකොට ඇති පළමුවෙනි උපලේඛනයේ පළමුවෙනි තීරුවේ සඳහන් පෙදෙස්වල, එම උපලේඛනයේ 2 වෙනි තීරුවේ විශෙෂිත මිළ ගණන්, සුද්ධ මිණුමින් වී සේරු 80ක් විකිණිය යුතු වැඩිම තොග මිළ ගණන් වන අතර, ඒ මිළ ගණන් වලට වඩා වැඩියෙන් තොග වශයෙන් වී නොවිකිණිය යුතු බැව් නියෝග කරමි.

(3) 1958වේ ජූලි මස 10වෙනි දින සිට, මෙයට යාකළ 2 වෙනි උපලේඛනයේ පළමුවෙනි තීරුවේ සඳහන් පෙදෙස්වල, එම උපලේඛනයේ දෙවෙනි තීරුවේ විශෙෂිත මිළ ගණන්, වී සේරුවක් විකිණිය යුතු වැඩිම සිල්ලර මිළ ගණන් වන අතර, ඒ මිළ ගණන් වලට වඩා වැඩියෙන් සිල්ලර වශයෙන් වී විකිණිය නො යුතු බැව් නියෝග කරමි.

(4) තවද මෙම නියෝගයෙහි කාර්‍ය්‍යය සඳහා—

(අ) මොනම වී ප්‍රමාණයක් වුව ද යලිත් විකිණීම සඳහා විකිණීමක් වුවහොත් ඒ විකිණීම තොග වශයෙන් විකිණීමක් බැව් ගණන් ගත යුතු බවත් ;

(ආ) මොනම වී ප්‍රමාණයක් වුවද පරිභෝගය සඳහා හෝ පාවිච්චිය සඳහා විකිණීමක් වුවහොත් ඒ විකිණීම සිල්ලරට විකිණීමක් බව ගණන් ගත යුතු බවත් ; සහ

(ඉ) '' සේරුව '' යන්නෙන් ගණන්ගත යුත්තේ සම්මත ක්වාට් වියලි සේරුව ;

බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) එසේම මෙම නියෝගයේ සඳහන් වී විකිණිය හැකි වැඩිම මිළ ගණන් බලපවත්නා සෑම පෙදෙසකම වෙන ද්‍රව්‍යයකට කලවම්කොට බාල කොට කිසිවෙක් සහල් නො විකිණිය යුතු බැව් නියම කරමි.

(6) එසේම මෙම නියෝගයෙහි සඳහන් වී විකිණිය හැකි වැඩිම මිළ ගණන් බලපවත්නා සෑම පෙදෙසකම, යම් තැනක හෝ යම් වාහනයක් තුල, හිමිවීමක් හෝ පාලනයක් යටතේ වී තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම පෙදෙස්හි වී විකිණිය යුතු වැඩිම මිළ ගණන් දක්වන නිවේදනයක් එම වාහනයේ හෝ ස්ථානයේ හොඳින් පෙනෙන සේ ප්‍රදර්ශනයකර තැබිය යුතු බැව් නියම කරමි.

(7) එසේම මේ නියෝගයෙහි සඳහන් වී විකිණිය හැකි වැඩිම මිළ ගණන් බලපවත්නා සෑම පෙදෙසෙකම, තොග වශයෙන් වී විකුණන සෑම කෙනෙකුම, වී මිල දී ගන්නාට රිසිට් පතක් දිය යුතු බව සහ සිල්ලර වශයෙන් වී විකුණන සෑම කෙනෙකුම වී මිල දී ගන්නා ඉල්ලුවහොත් ඔහුට රිසිට් පතක් දිය යුතු බැව් මෙයින් නියෝග කරමි. එම රිසිට් පතෙහි පහත සඳහන් දෑ අඩංගු විය යුතුයි :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ ප්‍රමාණය ;

(ඉ) විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල, සහ

(ඊ) වෙළඳාම කුමක්ද යන බව—එනම් තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන බව.

(8) එසේම වී විකුණන විට වී ඔතන දෙයෙහි නැතහොත් බහාලන දෙයෙහි මිළද මෙම නියෝගයෙහි නියම කරන ලද විකිණිය හැකි වැඩිම මිළ ගණන්වලට ඇතුළත් විය යුතු බැව් නියෝග කරමි.

අත්සන්කළේ 1958වේ ජූලි මස 11 වෙනි දින පෙරවරු 10 ටය.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවර එළිය දිස්ත්‍රික්කයේ
උඩ හේවාහැට කොට්ඨාශයේ නියෝජ්‍ය (ආහාර)
මිල පාලක.

කච්චේරිය,
මහනුවර.

1859—ජේ. ඇන්. ආර් 25001—5,267 (7/58)

## පළමුවෙනි උපලෙඛනය

| 1 වෙනි තීරුව | | 2 වෙනි තීරුව |
|---|---|---|
| | පෙදෙස | දළ වශයෙන් වී සේරු 80ක් විකිණිය හැකි වැඩිම තොග මිළ රු. ශ. |
| අ.—මහනුවර දිස්ත්‍රික්කය— | | |
| 1. | මහනුවර නාගරිකය හා ගහවට කෝරළය ... | 13 60 |
| | **උඩුනුවර සහ යටිනුවර** | |
| 2. | කටු ලියැද්ද ... ... ... | 12 85 |
| 3. | ගෙලිඔය ... ... ... | 12 94 |
| 4. | පිටුනුගම ... ... ... | 13 16 |
| 5. | දවුලාගල ... ... ... | 13 16 |
| 6. | දන්තුරේ ... ... ... | 13 01 |
| 7. | මැණික්දිවෙල ... ... ... | 13 16 |
| 8. | වේගිරිය ... ... ... | 13 08 |
| 9. | මුරුතලාව ... ... ... | 12 84 |
| 10. | වට්ටප්පොල ... ... | 12 86 |
| 11. | කඩුගන්නාව ... ... ... | 13 01 |
| 12. | ඊරියගම–පේරාදෙණිය ... ... | 12 88 |
| 13. | බත්ගොඩපිටිය ... ... | 13 21 |
| 14. | පොත්තෙපිටිය ... ... | 13 11 |
| 15. | අලකොලංග ... ... ... | 13 16 |
| | **තුම්පනේ** | |
| 16. | ගලගෙදර ... ... ... | 13 08 |
| 17. | හතරලියද්ද ... ... ... | 13 39 |
| | **හාරිස්පත්තුව** | |
| 18. | අරඹේකඩේ ... ... ... | 13 16 |
| 19. | පූජාපිටිය ... ... ... | 13 06 |
| 20. | කුරුගොඩ ... ... ... | 13 26 |
| 21. | හැදෙණිය ... ... ... | 13 11 |
| 22. | විගුහුම්පොල ... ... ... | 13 14 |
| 23. | අකුරණ, වැරැල්ලගම ... ... | 13 26 |
| 24. | කුලුගම්මන ... ... ... | 13 10 |
| 25. | බරිගම ... ... ... | 13 13 |
| 26. | යටිවැවල ... ... ... | 13 01 |
| 27. | වේලේකඩේ ... ... ... | 12 96 |
| 28. | පලිපාන ... ... ... | 12 89 |
| 29. | ගල්හින්න ... ... ... | 13 31 |
| 30. | අලවතුගොඩ ... ... ... | 13 31 |
| 31. | අන්කුඹුර ... ... ... | 13 51 |
| | **පාත දුම්බර** | |
| 32. | වත්තේගම ... ... ... | 12 98 |
| 33. | තෙල්දෙණිය ... ... ... | 13 38 |
| 34 | පන්විල ... ... ... | 13 13 |
| 35. | මඩවල ... ... ... | 13 01 |
| 36. | නවයාලතැන්න, කටුගස්තොට ... ... | 12 91 |
| 37. | පරණගම ... ... ... | 12 93 |
| 38. | හුලුගහ ... ... ... | 13 68 |
| 39. | කෙන්ගල්ල ... ... ... | 13 33 |
| 40. | දිගන ... ... ... | 13 28 |
| 41. | අඹතැන්න ... ... ... | 13 01 |
| 42. | මැණික්හින්න ... ... ... | 13 26 |
| | **උඩ දුම්බර** | |
| 43. | උඩිස්පත්තුව ... ... ... | 13 51 |
| 44. | ඌරුගල ... ... ... | 13 76 |
| 45. | හුන්නස්ගිරිය ... ... ... | 14 01 |
| 46. | මොරගහමුල ... ... ... | 13 76 |
| | **පාත හේවාහැට** | |
| 47. | මා රස්සන ... ... ... | 13 76 |
| 48. | පට්ටියගම කඩමංඩිය ... ... | 14 03 |
| 49. | තලාතුඔය ... ... ... | 13 41 |
| 50. | ගලහ ... ... ... | 13 76 |
| 51. | අම්පිටිය ... ... ... | 13 21 |
| | **උඩ පළාත** | |
| 52. | ගම්පොල ... ... ... | 12 91 |
| 53. | උලපණේ ... ... ... | 13 21 |
| 54. | පුස්සැල්ලාව ... ... ... | 13 16 |
| 55. | උඩවෙල ... ... ... | 13 01 |
| 56. | කලුගමුව ... ... ... | 13 26 |
| 57. | මුල්ගම ... ... ... | 14 01 |

| 1 වෙනි තීරුව | | 2 වෙනි තීරුව |
|---|---|---|
| | පෙදෙස | දළ වශයෙන් වී සේරු 80ක් විකිණිය හැකි තොග මිළ රු. ශ. |
| | **උඩ බුලත්ගම** | |
| 58. | නාවලපිටිය ... ... ... | 12 98 |
| 59. | හැටන් ... ... ... | 13 10 |
| 60. | නෝර්වුඩ් ... ... ... | 13 40 |
| 61. | ගිණිගත්හේන ... ... ... | 13 28 |
| 62. | බොගවන්තලාව ... ... | 13 48 |
| 63. | මස්කෙළිය–අක්කරවත්ත, නෝටන්බ්‍රිජ්–හානිෂ් ... | 13 73 |
| ආ.—නුවර එළි දිස්ත්‍රික්කයේ උඩහේවා හැට කොට්ඨාශය— | | |
| 64. | පදියපැලැල්ල ... ... ... | 14 21 |
| 65. | මතුරට ... ... ... | 14 66 |
| 66. | මානකොළ ... ... ... | 14 36 |
| 67. | රිකිල්ලගස්කඩ ... ... ... | 13 86 |
| 68. | රහතුන්ගොඩ ... ... ... | 14 31 |
| 69. | හඟුරන්කෙත ... ... ... | 13 46 |
| 70. | මුදුනපිට ... ... ... | 13 66 |
| 71. | කරල්ලියැද්ද ... ... ... | 13 91 |

## දෙවෙනි උපලෙඛනය

| 1 වෙනි තීරුව | | 2 වෙනි තීරුව |
|---|---|---|
| | පෙදෙස | වී සේරුවක් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ. ශත |
| අ.—මහනුවර දිස්ත්‍රික්කය— | | |
| 1. | මහනුවර නාගරිකය හා ගහවට කෝරළය ... | 17½ |
| | **උඩුනුවර සහ යටිනුවර** | |
| 2. | වේගිරිය ... ... ... | 17 |
| 3. | කඹුරාදෙණිය, කෙළියල් පිටිය ... ... | 18 |
| 4. | දවුලාගල ... ... ... | 18½ |
| 5. | උඩුනුවර, යටිනුවර කොට්ඨාශයේ ඉතිරි කොට්ඨාශ | 17½ |
| | **තුම්පනේ** | |
| 6. | තුම්පනේ කොට්ඨාශයේ සියලුම පෙදෙස්වල ... | 17½ |
| | **හාරිස්පත්තුව** | |
| 7. | අලවතුගොඩ, කුලුගම්මන ... ... | 16½ |
| 8. | අකුරණ, ගල්හින්න ... ... | 18½ |
| 9. | හාරිස්පත්තුව කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 17½ |
| | **පාත දුම්බර** | |
| 10. | වත්තේගම, නවයාලතැන්න ... ... | 17 |
| 11. | පාත දුම්බර කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 17½ |
| | **උඩ දුම්බර** | |
| 12. | උඩිස්පත්තුව, මොරගහමුල ... ... | 18½ |
| 13. | හුන්නස්ගිරිය ... ... ... | 19½ |
| 14. | උඩ දුම්බර කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 18 |
| | **පාත හේවාහැට** | |
| 15. | මාරස්සන, මහමැදගම, හේවාවිස්ස ... | 18½ |
| 16. | පට්ටියගම වෙළඳ පොල, වන හපුව, ඇතුල්ගම ... | 19½ |
| 17. | පට්ටියගම, උඩපිටිය, බෝපිටිය, කලව්ට්තැන්න, උඩුවෙල ... ... ... | 19 |
| 18. | පාත හේවාහැට කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 17½ |
| | **උඩ පළාත** | |
| 19. | අටබාගෙ ඉහලගම, අටබාගෙ උඩගම, දුණුකේවිල... | 18½ |
| 20. | ගම්පොළ ... ... ... | 18 |
| 21. | උඩ පළාත කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 17½ |
| | **උඩ බුලත්ගම** | |
| 22. | මස්කෙළිය ... ... ... | 18½ |
| 23. | නාවලපිටිය ... ... ... | 19 |
| 24. | උඩ බුලත්ගම කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 17½ |
| ආ.—නුවර එළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශය — | | |
| 25. | කරල්ලියැද්ද ... ... ... | 21½ |
| 26. | රහතුන්ගොඩ ... ... ... | 19½ |
| 27. | මතුරට ... ... ... | 19 |
| 28. | රිකිල්ලගස්කඩ, මුදුනපිට ... ... | 18½ |
| 29. | පදියපැලැල්ල, හඟුරන්කෙත ... ... | 18 |
| 30. | උඩ හේවාහැට කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 17 |

**සැලකිය යුත්තක්**.—(1) ඉහත සඳහන් මිළ ගණන් වී විකිණීමේ නියමිත මිළ නොවේ. ඒවා වී විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. ඒ මිළ ගණන් වලට වඩා ඉහලින් වී විකිණිය යුත්තේ නොවේ.

(2) ශුඩ මිනුමින් වී සේරු 80 ක් විකිණිය හැකි ඉහත සඳහන් තොග මිළ ගණන් අනුව, ශුද්ධ මිණුමින් වී සේරු 80කට වඩා අඩු හෝ වැඩි වී ප්‍රමාණයක් විකිණිය හැකි වැඩිම තොග මිළ ගණන්, ඒ ඒ වී ප්‍රමාණයන් අනුව සදා ගත යුතුයි.

ඇම්. ඇල්. 1958/අයි වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය.

අතිරේක ආහාර ද්‍රව්‍ය.

## 1950 අංක 29 දරණ මිළ පාලන පණත

### නියෝගය

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් බන්දුල සෝමසිරි ද සිල්වා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 ජූනි 10 වෙනි දින, අංක 11,353 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, 1958 ජූනි 5 වෙනි දින ඇම්. ඇල්. 1958/ඊ දරණ ආහාර මිළ නියෝගයේ 2 වෙනි උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් මසූර් පරිප්පු, උලුඳු (පියලි නොකළ), කඩල පරිප්පු සහ අර්තාපල් පිළිබඳව, එම උපලේඛනයෙහි 3 සහ 4 වෙනි තීරයන්හි පිළිවෙළින් සඳහන්, තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද, මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති 2 වෙනි උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, 1 වෙනි උප ලේඛනයේ පැහැදිළිව දක්වෙන පරිදි මාතලේ පාලන දිස්ත්‍රික්ක සීමාව තුළ විකිණිය හැකි වැඩිම මිළ 2 වෙනි උපලේඛනයේ 3 වෙනි සහ 4 වෙනි තීරවල අනුපිළිවෙළින් සඳහන්කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය පිළිබඳව, 1958 ජූනි 10 වෙනි දින, අංක 11,353 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 ජූනි 5 වෙනි දින, ඇම්. ඇල්. 1958/ඊ වෙනි ආහාර මිළ නියෝගයේ (3) සිට (8) දක්වා ඡෙදයන් සහ 1වෙනි උපලේඛනයද, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැළකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ජූලි මස 10 වෙනි දින, පස්වරු 4ට මාතලේදී අත්සන් තබන ලදී.

බන්දුල ඇස්. ද සිල්වා,
මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.

### 2වෙනි උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය | 4 වෙනි තීරය |
|---|---|---|---|
| විස්තරය | කොට්ඨාශය | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩි මිළ<br>රු. ශ. |
| මසූර් පරිප්පු ... ... ... | 1 ... | 55 97 ... | 0 55 |
| | 2 ... | 56 38 ... | 0 56 |
| | 3 ... | 56 66 ... | 0 57 |
| | 4 ... | 58 22 ... | 0 58 |
| උලුඳු (පියලි නොකළ) ... ... ... | 1 ... | 48 84 ... | 0 48 |
| | 2 ... | 49 20 ... | 0 49 |
| | 3 ... | 49 45 ... | 0 49 |
| | 4 ... | 50 80 ... | 0 51 |
| කඩල පරිප්පු ... ... ... | 1 ... | 41 56 ... | 0 41 |
| | 2 ... | 41 87 ... | 0 42 |
| | 3 ... | 42 08 ... | 0 42 |
| | 4 ... | 43 23 ... | 0 43 |
| අර්තාපල් ... ... ... | 1 ... | 30 29 ... | 0 32 |
| | 2 ... | 30 51 ... | 0 32 |
| | 3 ... | 30 67 ... | 0 33 |
| | 4 ... | 31 51 ... | 0 34 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නො විකිණිය යුතුයි.

---

1958 අංක 11 දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය.

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

ගාලු පාලන දිස්ත්‍රික්කයේ, සහකාර ආහාර මිළ පාලක තැන්පත් හේවා ඩැනී වීරරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් සහ එම පනතේ 3(2) වැනි වගන්තියෙන්ද, මා හට පැවරී තිබෙන බලතල අනුව :—

(1) 1958 ජූනි මස 10 වැනි දින, අංක 11,353 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරණලද 1958 ජූනි 3 වැනි දින, අංක 5 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් මසූර් පරිප්පු, උළුඳු (පියලි නොකළ) කඩල පරිප්පු සහ අර්තාපල් පිළිබඳව, එම උප ලේඛනයෙහි 3 සහ 4 වැනි තීරයන්හි පිළිවෙළින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද, මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොන්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, එම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ, මේ දුන් පටන් මේ උප ලේඛනයේ 3 වැනි හා 4 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය පිළිබඳව 1958 ජූනි මස 10 වැනි දින, 11,353 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධව 1958 ජූනි 3 වැනි දින, අංක 5 වැනි ආහාර මිළ නියෝගයේ 3 වැනි සිට 8 දක්වා ඡෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැලකියයුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ජූලි මස 10 වැනි දින පස්වරු 2 ට ගාල්ලේ දී අත්සන් තබන ලදී.

එච්. ඩී. වීරරත්න,
සහකාර ආහාර මිළ පාලක තැන.
ගාලු පාලන දිස්ත්‍රික්කය.

## උප ලේඛනය

| 1 වැනි තීරය පළාත් | 2 වැනි තීරය විස්තර | 3 වැනි තීරය තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොන්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | 4 වැනි තීරය සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|---|---|
| | | රු. ශ | රු. ශ |
| ගාලු නාගරික සීමාව සහ කඩවත් සතර | මසූර් පරිප්පු ... | 55 42 ... | 0 55 |
| අම්බලන්ගොඩ පලාත් ආණ්ඩු සීමාව ... | (උළුඳු (පියලි නොකළ) ... | 48 36 ... | 0 49 |
| දෙඩන්දූව සුළු නගර සභා සීමාව ... | කඩල පරිප්පු ... | 41 17 ... | 0 41 |
| හික්කඩුව සුළු නගර සභා සීමාව ... | අර්තාපල් ... | 30 00 ... | 0 32 |
| වතුගෙදර සුළු නගර සභා සීමාව ... | | | |
| බලපිටිය සුළු නගර සභා සීමාව | | | |
| ගම්කායඞ සභා | | | |
| අහන්ගම ... ... | | | |
| අක්මීමන ... ... | | | |
| බද්දේගම ... ... | | | |
| බටපොල ... ... | | | |
| බෙන්තොට ... ... | | | |
| බෝපේ ... ... | | | |
| ඇල්පිටිය ... ... | | | |
| හබරාදූව ... ... | | | |
| හික්කඩුව ... ... | | | |
| කොස්ගොඩ ... ... | මසූර් පරිප්පු ... | 55 42 ... | 0 55 |
| කරන්දෙනිය ... ... | උළුඳු (පියලි නොකළ) ... | 48 36 ... | 0 49 |
| කෝදගොඩ ... ... | කඩල පරිප්පු ... | 41 17 ... | 0 41 |
| කොට්ටව ... ... | අර්තාපල් ... | 30 00 ... | 0 32 |
| මාදම්පෙ ... ... | | | |
| නාගොඩ ... ... | | | |
| පෝද්දල ... ... | | | |
| රත්ගම ... ... | | | |
| තෙලිකඩ–මා ජුවාන ... ... | | | |
| වඳුරඹ ... ... | | | |
| වැලිවිටිය–දිවිතුරේ ... ... | | | |
| වැයිහේන ... ... | | | |
| වේරගොඩ ... ... | | | |
| | | රු. ශ | රු. ශ |
| හිනිදුම සහ ඕපාත ගම්කායඞ සභා සීමාවන් ඇතුලත ... | මසූර් පරිප්පු ... | 56 87 ... | 0 58 |
| | උළුඳු (පියලි නොකළ) ... | 49 21 ... | 0 50 |
| | කඩල පරිප්පු ... | 41 97 ... | 0 43 |
| | අර්තාපල් ... | 31 00 ... | 0 35 |
| නෙළුව ගම්කායඞ සභාව ඇතුලත ... ... | මසූර් පරිප්පු ... | 58 37 ... | 0 59 |
| | උළුඳු (පියලි නොකළ) ... | 50 21 ... | 0 55 |
| | කඩල පරිප්පු ... | 42 97 ... | 0 48 |
| | අර්තාපල් ... | 32 00 ... | 0 36 |

**සැලකිය යුතුයි.**—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

ඇෆ්. සී./ඇම්/8 **අතිරේක ආහාර ද්‍රව්‍ය.**

### 1950 අංක 29 දරණ මිල පාලන පනත

#### නියෝගය

හලාවත පුත්තලම් මිළ (ආහාර) පාලක තැන්පත් ජෝන් වින්සන්ට් ඥානප්‍රගාසම් වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිළ (ආහාර) පාලක වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 58.6.4 වෙනි දින, අංක 11,353 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 58.6.4. වෙනි දින, ඇෆ්.සී/ඇෆ්/5 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් මසූර්පරිප්පු, උලුඳු (පියලි නොකළ) කඩලපරිප්පු සහ අර්තාපල් පිළිබඳව, එම උප ලේඛනයෙහි 3, 4 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන්, තොග වෙළෙන්දකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දකු ගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, පුත්තලම, හලාවත, සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ, මේ දුන් පටන්, මේ උපලේඛනයේ 3 වැනි සහ 4 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය පිළිබඳව 10.6.58 වෙනි දින අංක 11,353 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 4.6.58 වෙනි දින ඇෆ්.සී/ඇෆ්/5 වෙනි ආහාර මිළ නියෝගයේ (II) සිට (III) දක්වා ඡෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැළකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ජූලි 10 වෙනි දින පුත්තලමේදී පෙරවරු 11ට අත්සන් තබන ලදි.

1958 ජූලි මස 9 වෙනි දින,
පුත්තලමේදී

ජෝන් වින්සන්ට් ඥානප්‍රගාසම්,
මිළ (ආහාර) පාලක
පුත්තලම හලාවත දිස්ත්‍රික්කයන්හි.

## උපලෙඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>විස්තර | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දකු විසින් සිල්ලර වෙළෙන් දකුට දළ බර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධ බර රාත්ත ලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| දකුණු පිටිගල් කෝරළේ ප්‍රාදේශික ආදයම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශ | මසූර් පරිප්පු ... | 55 21 ... | 0 56 |
| | උලුඳු (පියලි නොකළ) ... | 48 61 ... | 0 49 |
| | කඩල පරිප්පු ... | 41 52 ... | 0 42 |
| | අර්තාපල් ... | 30 15 ... | 0 32 |
| උඩප්පුව, බත්තුළුඔය සහ පුලිච්චකුලම හැර උතුරු පිටිගල් කෝරළේ ප්‍රාදේශික ආදයම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශ | මසූර් පරිප්පු ... | 55 40 ... | 0 56 |
| | උලුඳු (පියලි නොකළ) ... | 48 82 ... | 0 50 |
| | කඩල පරිප්පු ... | 41 72 ... | 0 42 |
| | අර්තාපල් ... | 30 29 ... | 0 32 |
| පුත්තලමේ උප නගර සභාවේ ප්‍රදේශ සහ හලාවත උතුරු පිටිගල් කෝරළේ ප්‍රාදේශික ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයට අයිති උඩප්පුව, බත්තුළුඔය, සහ පුලිච්චකුලම | මසූර් පරිප්පු ... | 55 75 ... | 0 57 |
| | උලුඳු (පියලි නොකළ) ... | 49 78 ... | 0 50 |
| | කඩල පරිප්පු ... | 42 62 ... | 0 42 |
| | අර්තාපල් ... | 30 89 ... | 0 33 |
| පුත්තලම උප නගර සභාවේ ප්‍රදෙශ හැර පුත්තලම් පත්තු සහ ග්‍රැවට්හි ප්‍රාදේශික ආදයම් නිලධාරි තැනගේ සියළුම ප්‍රදේශ | මසූර් පරිප්පු ... | 56 62 ... | 0 56 |
| | උලුඳු (පියලි නොකළ) ... | 50 19 ... | 0 50 |
| | කඩල පරිප්පු ... | 43 02 ... | 0 42 |
| | අර්තාපල් ... | 31 15 ... | 0 33 |
| ඒත්තාලේ සහ ආණමඩුව ... ... ... | මසූර් පරිප්පු ... | 56 74 ... | 0 56 |
| | උලුඳු (පියලි නොකළ) ... | 50 33 ... | 0 50 |
| | කඩල පරිප්පු ... | 43 15 ... | 0 43 |
| | අර්තාපල් ... | 31 23 ... | 0 33 |
| ඒත්තාලේ හැර කල්පිටිය ප්‍රාදේශික ආදයම් නිලධාරි තැනගේ සියළුම ප්‍රදේශද ආණමඩුව හැර, දෙමළ හත්පත්තුව ප්‍රාදේශික ආදයම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශ | මසූර් පරිප්පු ... | 56 85 ... | 0 56 |
| | උලුඳු (පියලි නොකළ) ... | 50 45 ... | 0 50 |
| | කඩල පරිප්පු ... | 42 26 ... | 0 43 |
| | අර්තාපල් ... | 31 31 ... | 0 33 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

**ආර්/9/1958 වැනි අංක දරණ මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය**

## 1950 හේ අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිල පාලක තැන්පත් මෙතියස් ස්ටීවන් ක්ලිටස් ගුණවර්ධන වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 ජූනි මස 9 වෙනි දින, අංක 11,352 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසැට් පත්‍රයේ පළ කරන ලද 1958 ජූනි මස 4 වෙනි දින අංක ආර්/7/1958 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 2වෙනි තීරයෙහි සඳහන් මසූර් පරිප්පු, උලුඳු (පියළි නොකළ), කඩල පරිප්පු සහ අර්තාපල් පිළිබඳව, එම උපලේඛනයෙහි 3වෙනි සහ 4වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද, මෙම නියෝගයෙන් අද දින සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වෙනි තීරයෙහි සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩර යක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, උපලේඛනයෙහි 1වෙනි තීරයෙහි සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දින් පටන්, එහි 3වෙනි, හා 4වෙනි තීරවල අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උපලේඛනයෙහි සඳහන් ද්‍රව්‍ය පිළිබඳව, 1958 ජූනි මස 9වෙනි දින අංක 11,352 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධව 1958 ජූනි මස 4 වෙනි දින, අංක ආර්/7/1958 දරණ ආහාර මිළ නියෝගයේ 3 සිට 8 දක්වා ඡෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර් ගතවූ හැටියට සැළකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ජූලි මස 12 වෙනි දින පෙරවරු 10ට රත්නපුර කච්චේරියේදී අත්සන් කරන ලදි.

ඇම්. ඇස්. සී. ගුණවර්ධන,
රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>විස්තර | 3 වැනි තීරය<br>තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| (1) (අ) රත්නපුර පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය, (ආ) ගවරගිරිය වසම හැර කුකුළු කෝරළේ පල්ලේ පත්තුව, (ඇ) එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම් මුලාදැනි වසම හැර කුරුවිටි කෝරළේ උඩ පත්තුව සහ කලටුවාව නැගෙනහිර යන ගම්මුලාදැනි වසම් | මසූර් පරිප්පු ... | 55 58 ... | 0 56 |
| | උලුඳු (පියළි නොකළ) ... | 48 76 ... | 0 49 |
| | කඩල පරිප්පු ... | 41 79 ... | 0 42 |
| | අර්තාපල් ... | 31 0 ... | 0 33 |

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>විස්තර | 3 වැනි තීරය<br>තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ | 4 වැනි තීරය<br>සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ |
|---|---|---|---|
| (2) කලටුවාව නැගෙනහිර ගම්මුලාදැනි වසම හැර කුරුවිටි කෝරළේ පල්ලෙ පත්තුව සහ කරඳන ගම්මුලාදැනි වසම හැර කුරුවිටි කෝරළේ මැද පත්තුව | මසූර් පරිප්පු ... | 55 53 ... | 0 55 |
| | උලුඳු (පියලි නොකළ) ... | 48 51 ...... | 0 48 |
| | කඩල පරිප්පු ... | 41 54 ... | 0 41 |
| | අර්තාපල් ... | 30 75 ... | 0 32 |
| (3) (අ) නවදුන් කොරළේ උඩ පත්තුව, මැද පත්තුව, සහ පල්ලේ පත්තුව, (ආ) කුකුළු කෝරළේ මැද පත්තුව | මසූර් පරිප්පු ... | 55 73 ... | 0 57 |
| | උලුඳු (පියලි නොකළ) ... | 48 91 ... | 0 50 |
| | කඩල පරිප්පු ... | 41 94 ... | 0 43 |
| | අර්තාපල් ... | 31 15 ... | 0 34 |
| (4) (අ) බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය, (ආ) රක්වාන සුළු නගර සභා ප්‍රදේශය, (ඇ) කුරුවිටි කෝරළේ එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදැනි වසම්, (ඈ) කල්තොට වසම හැර කඩවත මැද කෝරලේ හෙල පල්ලේ පළාත, හෙල උඩ පළාත සහ උඩුවග්ගම් පත්තුව, (ඉ) අටකලං කෝරලේ පන්නිල් පත්තුව, මැද පත්තුව සහ පලලේ බැද්ද ගම්මුලාදැනි වසම; (ඊ) කුකුළු කෝරළේ උඩ පත්තුව සහ ගවරගිරිය ගම් මුලාදැනි වසම | මසූර් පරිප්පු ... | 55 83 ... | 0 58 |
| | උලුඳු (පියලි නොකළ) ... | 49 01 ... | 0 51 |
| | කඩල පරිප්පු ... | 42 04 ... | 0 44 |
| | අර්තාපල් ... | 31 25 ... | 0 35 |
| (5) (අ) කොළොන්නා කෝරළේ කොළොන්නාගම් පත්තුව සහ දියපොට ගම් පත්තුව, (ආ) කඩවත කෝරලේ තල් පිටි ගම් පත්තුව, (ඇ) අටකලං කෝරලේ පල්ලේ බැද්ද ගම්මුලාදැනි වසම හැර දෙපත්තුව, (ඈ) මැද කෝරළේ කල්තොට වසම | මසූර් පරිප්පු ... | 56 08 ... | 0 59 |
| | උලුඳු (පියලි නොකළ) ... | 49 26 ... | 0 52 |
| | කඩල පරිප්පු ... | 42 29 ... | 0 45 |
| | අර්තාපල් ... | 31 50 ... | 0 36 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

**කේ. ඊ. 38 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

කෑගලු දිසාවේ උප (ආහාර) මිළ පාලක තැන්පත් නාගමුත්තු පුලේන්දිරන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු අංක 4 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 ජූනි 6 වෙනි දින අංක 11,345 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පලකරන ලද 1958 ජූනි 3 වෙනි දින කේ. ඊ. 36 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් මයිසූර් පරිප්පු, උළුඳු (පියලි නොකළ), කඩල පරිප්පු සහ අර්තාපල් පිළිබඳව එම උපලේඛනයෙහි 2 වෙනි සහ 3 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද කෑගල්ල දිස්ත්‍රික්කයේ සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දන් පටන්, මේ උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය පිළිබඳව 1958 ජූනි 6 වෙනි දින අංක 11,345 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 ජූනි 3 වෙනි දින කේ. ඊ. 36 වෙනි ආහාර මිළ නියෝගයේ (3) සිට (8) දක්වා ඡෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැලකියයුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ජූලි මස 11 වෙනි දින පස්වරු 2ට කෑගල්ලේදී අත්සන් කරන ලදී.

නාගමුත්තු පුලේන්දිරන්,
උප (ආහාර) මිළ පාලක තැන.

### උපලේඛනය

| 1 වැනි තීරය<br>විස්තර | 2 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ | 3 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ |
|---|---|---|
| මයිසූර් පරිප්පු ... ... ... | 55 88 ... | 0 56 |
| උළුඳු (පියලි නොකළ) ... ... ... | 48 76 ... | 0 49 |
| කඩලපරිප්පු ... ... ... | 41 50 ... | 0 41 |
| අර්තාපල් ... ... ... | 30 24 ... | 0 32 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළවේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.